# අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය
අத்தியாவசிய சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்
OFFICE OF THE COMMISSIONER GENERAL OF ESSENTIAL SERVICES


**2025-නොවැ-30 : 10.30PM**

# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2464/31 හා 2025.11.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව පත් කරන ලද අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් වශයෙන් මා වෙත පැවරී ඇති අධිකාරිය ප්‍රකාරව, පොදු උපයෝගිතා සේවාවන් යථාවත් කිරීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීම ආරම්භ කර ඇත.

මේ යටතේ සියළු පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් ඒ ඒ පළාතේ යටිතල පහසුකම් වලට සිදුවී ඇති හානි ඇස්තමේන්තු කොට කඩිනමින් මා වෙත දැනුම් දීමටත්, ආහාර හා අනෙකුත් අත්‍යාවශ්‍ය සේවා පිළිබඳ ගැටළු හඳුනා ගනිමින් ඒවාට විසඳුම් ක්‍රියාමාර්ග ගැනීමටත් උපදෙස් දෙන ලදි.

**විශේෂයෙන්, මේ යටතේ පළාත් සභාවක් යටතේ වන පළාත් පාලන ආයතනයක උපකරණ සහ මානව සම්පත ආපදාවට පත් වෙනත් පළාත් සභාවක යටතේ වන පළාත් පාලන ආයතන වලට සැපයීමට අවශ්‍ය බලය මා විසින් පළාත් ප්‍රධාන ලේකම් වරුන් වෙත පවරන ලදි.**

මීට අමතරව, ආපදා සහන සේවා කඩිනමින් අදාල ජන කොටස් වෙත සපයා දීම සම්බන්ධයෙන් පවතින ගැටළු දිස්ත්‍රික් ලේකම්වරු සමඟ සාකච්ඡා කර ඇති අතර ඒවාටද කඩිනම් විසඳුම් ක්‍රියාමාර්ග යෙදීමට සැලසුම් සකස් කිරීමට උපදෙස් දෙන ලදි.

තවද, අද දිනය තුල, මෙට්‍රික් ටොන් 3955ක ප්‍රමාණයක LP ගෑස් නෞකාවක්, කොළඹ වරාය තුල ගොඩබෑමට නොහැකි වීම හේතුවෙන් හම්බන්තොට වරායෙන් ගොඩබෑමට අනුමත කිරීම සිදු වූ අතර , හලාවත ලංකා සතොස ගබඩාව විවෘත කොට එහි ඇති ආහාර ද්‍රව්‍ය , ආපදාවට ලක්වූ පිරිසට ලබාදීම සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාට බලය ලබාදෙන ලදි.

එමෙන්ම, මෙම බරපතල ආපදා අවස්ථාවේදී, ආපදාවට ලක්ව ඇති පිරිසට ආහාරපාන සහ අනෙකුත් සියළු අත්‍යාවශ්‍ය සේවා සැපයීම සඳහා රාජ්‍ය නිලධාරීන් උපරිම කැපවීමෙන් කටයුතු කරමින් සිටින බවත් ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය ශක්තිය ලබා දෙමින් ජන ජීවිතය නැවත යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය සියළු කටයුතු සම්පාදනය කර ඇති බවත් දන්වමි.

මෙම අසීරු අවස්ථාවේදී අවබෝධයෙන් කටයුතු කරන සමස්ථ ශ්‍රී ලාංකික ජනතාව වෙත මාගේ ගෞරවණීය ස්තූතිය පිරිනමමි.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්